(76)

දුරකථන/தொலைபேசி இல/Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ......................................

මගේ අංකය / எமது இல. / My No. } ED/1/102/කෘෂි/98 - I

දිනය / திகதி / Date } 2012.12.28

චක්‍රලේඛ අංක :- 02/2013

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම විදුහල්පතිවරුන්

## දිවි නැගුම ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමී ව පාසල් භූමිය ආදර්ශවත් ගෙවත්තක් බවට පත් කිරීමේ වැඩසටහන

1.0 හැඳින්වීම

'මහින්ද චින්තන ඉදිරි දැක්ම' ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව අනුව ක්‍රියාත්මක වන දිවි නැගුම ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමී ව පාසල් භූමිය ආදර්ශවත් ගෙවත්තක් බවට පත් කිරීමේ වැඩසටහන සියලු ම පාසල්වල ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය බලාපොරොත්තු වේ.

මෙම ජාතික වැඩසටහනට පාසල් පද්ධතිය සම්බන්ධ කර ගනිමින් පාසල, දිවි නැගුම ආදර්ශ පාසලක් බවට පත් කිරීමත්, ගුරුවරයා පාසල් පද්ධතිය තුළ ආදර්ශවත් නියමුවෙකු බවට බල ගැන්වීම තුළින් ඔවුන්ගේ සක්‍රිය දායකත්වය ප්‍රායෝගික අත්දැකීම් මත ශිෂ්‍යයා නම් පවුලේ සාමාජිකයින් වෙත දිවි නැගුම වැඩසටහනේ හරය රැගෙන යන්නකු බවට පත් කිරීමත් අපේක්ෂා කෙරේ.

මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ පාසල් හා අධ්‍යාපන කාර්යාල සතුව ඇති වගා කළ හැකි ඉඩම් ඵලදායී ලෙස වගා කිරීමට ද බලාපොරොත්තු වේ. තවද වගා කළ හැකි ඉඩම් නොමැති නාගරික පාසල්වල ද නාගරික කෘෂිකර්මය යොදා ගත යුතුය.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී සිසුන්ට කෘෂිකර්මය පිළිබඳ නව දැනුම ලබා දීමටත්, ශ්‍රමාභිමානය හා කෘෂිකර්මය පිළිබඳ ශුභවාදී ආකල්ප ගොඩනැංවීමටත්, සිසුන්ගේ ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කිරීමටත් බලාපොරොත්තු වන අතර වැඩසටහන සඳහා කෘෂිකර්ම විෂය හදාරන සිසුන් පමණක් නොව සියලු ම සිසුන් සහ ගුරුවරුන් සහභාගි කර ගත යුතු බවටත් අපේක්ෂා කෙරේ.

2.0 වැඩසටහනේ සුවිශේෂ අරමුණු

- සියුන් තුළ බෝග වගාව සහ සත්ත්ව පාලනය පිළිබඳ ව උද්යෝගය ජනිත කිරීම.

- ශිෂ්‍ය විවේක කාලය ඵලදායී ක්‍රියාවකට යෙදවීමට හුරු කරවීම.

- සියුන් තුළ ශ්‍රමාභිමානයක් ඇති කිරීම.

- පාසල්වල ඇති සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම.

- පවුලේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම.

- පවුලේ ආර්ථිකය සවිබල ගැන්වීම උදෙසා අතිරේක ආදායම් මාර්ග බිහි කිරීම.

- කාබනික පොහොර නිෂ්පාදනය තුළින් අපතේ යන ද්‍රව්‍යවලින් උපරිම ප්‍රයෝජන ගැනීම.

- පරිසර සංරක්ෂණයට දායක වීම හා පාසල් පරිසරය වඩාත් ඇකුම්කලු කිරීම.

- ස්වයංපෝෂිත ජීවන රටාවකට අනාගත පරපුර හුරු කිරීම.

3.0 වැඩසටහන මඟින් පාසලට ලැබෙන ප්‍රතිලාභ

- පාසල් භූමි අලංකරණය

- පාසල් ගෙවත්ත වගා කිරීම

- කාබනික පොහොර නිෂ්පාදනය මඟින් අපතේ යන ද්‍රව්‍යවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම.

- පාසල හා ප්‍රජාව අතර සම්බන්ධතා ඇති වීම.

4.0 වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය

- මෙම වැඩසටහන පිළිබඳ ව කලාප හා කොට්ඨාස අධ්‍යක්ෂවරුන්, පළාත් හා කලාප මට්ටමේ සේවය කරන නි.අ.අ./ ස.අ.අ. (කෘෂි) හා කෘෂිකර්ම ගුරු උපදේශකවරුන් දැනුවත් කිරීම සිදු කරන අතර, ඔවුන් මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහාය ලබා දීම, ව්‍යාපෘතිය ඇගයීම, නියාමනය හා ප්‍රගතිය පරික්ෂා කිරීමට බලාපොරොත්තු වේ.

- වැඩසටහන සම්බන්ධීකරණය සඳහා පළාත් හා කලාප මට්ටමින් නිලධාරියකු තෝරා පත්කරගත යුතුය. පාසල්වල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, පාසලේ ගුරුභවතුන්, ආදි ශිෂ්‍ය සංගමයේ නියෝජිතයින් හා පාසල් සංවර්ධන සමිතියේ නියෝජිතයින්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් මඟින් සිදු කළ යුතුය.

- ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය බීජ, පොහොර ආදිය මිලදී ගැනීම සඳහා පාසලට ගුණාත්මක යෙදවුම් යටතේ වෙන්වී ඇති මුදල් යොදා ගත හැකි අතර, වගාවෙන් ලැබෙන ආදායම පාසල් සංවර්ධන

සමිතියට බැර කොට පාසල් සංවර්ධන සමිති චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට අනුකූල ව වගා කටයුතු දිර්ඝකාලීන ව පවත්වාගෙන යා යුතුය.

- කෘෂි දේශගුණික කලාප අනුව යොදා ගත යුතු බෝග හා වගා ක්‍රම මෙන් ම නාගරික පාසල් අරමුණු කරගෙන නාගරික ගෙවතු ක්‍රමවේද පිළිබඳව තාක්ෂණික සහාය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙතින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

- පාසල් භූමිය සතුව වැඩි ඉඩ ප්‍රමාණයක් තිබේ නම් ආහාර සඳහා මෙන්ම ඇවමය හා ඖෂධීය වටිනාකමකින් යුත් බහු වාර්ෂික බෝග වගාව ද කළ යුතුය.

- පාසල් වැඩසටහනට සමගාමී ව පළාත්, කලාප හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාල භූමි ද පාසල් නිල නිවාස භූමි පරිශ්‍රවල ද බෝග වගා කිරීමට කටයුතු යෙදිය යුතුය.

5.0 වැඩසටහන යටතේ යෝජිත ක්‍රියාකාරකම්

- පාසල් ගෙවත්ත සැලසුම් කිරීම
- භූමිය සකස් කිරීම
- බෝග සංස්ථාපනය
  එළවළු, පලතුරු, ධාන්‍ය, පලා වර්ග, අල බෝග, ඖෂධීය ශාක සහ බහු වාර්ෂික බෝග
- විවිධ තවාන් වර්ග පිහිටුවීම
- කාබනික පොහොර නිෂ්පාදනය
  - කොම්පෝස්ට් නිෂ්පාදනය
  - කාබනික දියර පොහොර
- ජීව වායු ඒකක පවත්වා ගැනීම
- සීමිත ඉඩකඩක වගා කිරීම
  - බඳුන්ගත වගා, වගා කුළුණු, වගා මළු, නිර්පාංශු වගාව (රිජිෆෝම් පෙට්ටි, කොහුබත් පිරවූ පොලිතින් බෑග්)
- වාණිජ කෘෂිකර්මය
  - බීම්මල් වගාව
  - විසිතුරු පැළ වගාව
  - මල් වගාව
  - වාණිජ වටිනාකමක් ඇති බද්ධ පැළ නිෂ්පාදනය
- ක්ෂුද්‍ර ජල සම්පාදනය, ආරක්ෂිත ගෘහ තුළ වගාව වැනි නව තාක්ෂණය ආදර්ශනය කළ හැකි නම් ඒ සඳහා සුදුසු ආයතන සමඟ සම්බන්ධ වීම හෝ පාසල් සංවර්ධන සමිති මැදිහත් වීම මඟින් හෝ ක්‍රියාත්මක කිරීම කළ හැකිය.

6.0 පශ්චාත් රෝපණ කටයුතු

වගා භූමිය කොටස් වලට බෙදා පන්ති මට්ටමින් පශ්චාත් රෝපණ කටයුතු හා නඩත්තු කිරීම් කළ යුතුය.

7.0 නියාමනය හා ප්‍රගති සමාලෝචනය

ත්‍රෛමාසිකව මෙම වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ලබා දිය යුතු අතර, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් අධ්‍යාපන අමාත්‍යාංශයේ කෘෂිකර්ම ශාඛාව වෙත ප්‍රගතිය වාර්තා කළ යුතුය. කලාප හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල සේවය කරන ගුරු උපදේශකවරුන් හා කෘෂිකර්ම විෂයය භාර සහකාර අධ්‍යාපන 'අධ්‍යක්ෂවරුන් විසින් තම කලාපයේ පාසල්වල වගා කටයුතු නියාමනය කළ යුතු අතර අවශ්‍ය උපදෙස් පාසල්වලට ලබා දිය යුතුය.

පාසලෙහි සම්පත් උපයෝගී කරගෙන ඉහත ක්‍රියාකාරකම්වලින් ක්‍රියාත්මක කළ හැකි අංශ තෝරාගෙන අඛණ්ඩ ව වාර්ෂික ව ක්‍රියාත්මක කළ යුතුය.

ජාතික අවශ්‍යතාවක් ලෙස සලකා මෙම වැඩසටහන ඵලදායී ව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සැමගේ සක්‍රීය දායකත්වය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

එස්.එම්. ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :

1. නි.අ.අ./ස.අ.අ. (කෘෂි) - වැඩසටහන ක්‍රියාත්මක කිරීම, නියාමනය හා ඇගයීම සඳහා
2. ගුරු උපදේශක (කෘෂි) - වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා නියාමනය සඳහා